Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Provincial Department of Education - NWP**

**8 ශ්‍රේණිය** **පළමු වාර පරීක්ෂණය - 2019** **40 S**

නම ..............................................

**පෙරදිග සංගීතය** **කාලය පැය දෙකයි**

●**සැළකිය යුතුයි:-**

● **සියලුම ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර සපයන්න.**

01. බිලාවල් රාගයේ,
I. සියළු ස්වර ශුද්ධව යෙදේ ii. රිගධනි කෝමලව යෙදේ
iii. තීව්‍ර මධ්‍යමය යෙදේ iv. ගනි පමණක් කෝමලව යෙදේ.

02. " සිරස නමමු මව් පොළවට" යන ගීතයේ මුල් ස්වර පාදය
I. ගමරි/ ගමප/ සරිග/ මපප ii. ගමප/ ගමරි / සරිග / රිසස
iii. ගගම / මමග/ සරිග / රිසස iv. සනිධ / නිධප / ධපම / පමග වේ.

03. හින්දුස්ථානී සංගීතයේ ප්‍රධාන තාලවාද්‍ය භාණ්ඩය
I. තබ්ලාව ii. මද්දලය iii. උඩැක්කිය iv. බේස් ඩ්‍රම් යි

04. සිතාරයේ සහ එස් රාජයේ ප්‍රධාන තත සුසර කරනු ලබන්නේ
I. ස ස්වරයට ය ii. ප ස්වරයට ය iii. ප ස්වරයට ය iv. ම ස්වරයට ය

05 ස්වර පිහිටීම අතින් සමාන හින්දුස්ථානී භාණ්ඩ යුගලය වන්නේ
I. එස් රාජය, වයලීනය ii. ගිටාරය, සිතාරය
iii. සිතාරය , එස් රාජය iv. වයලීනය, ගිටාරය යි

06. බටහිර සංගීතයේ දී "BAR" යන්නෙන් හඳුන්වන්නේ
I. මාත්‍රා ii. විභාග iii. සමග්‍රහය iv. ආවර්තය යි

07. " මූදු පුත්තු" නාට්‍යය නිෂ්පාදනය කළේ,
I. ගුණසේන ගලප්පත්ති මහතාය ii. සෝමදාස ඇල්විටිගල මහතාය
iii. මහගම සේකර මහතාය iv. පී. වැලිකල මහතාය

08. හින්දුස්ථානි තාලයක ප්‍රහලම මෙන්ම ආරම්භක ස්ථානය
I. දෙවන අනුතාල ස්ථානයයි ii. ආවර්තයයි ය
iii. බලිය යි iv. සමග්‍රහය යි

09. තත් වාද්‍ය භාණ්ඩයක් <u>නොවන්නේ,</u>
I. ගිටාරය යි ii. සිතාරය යි iii. බටනලාව යි iv. එස් රාජය යි

10. සප්තකය තුළ ඇති අචල ස්වර ගණන
I. 05 කි ii. 04 කි iii. 02 කි iv . 03 කි

● **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**
( මාත්‍රාව, නූර්ති, මිස්රාබය, දේශාභිමානී, සුෂිර )

11. "ලෝනා මුණි රාජගේ ..." යන ගීතය ...................................................................... ගීතයකි.

12. ලංකා ලංකා පෙම්බර ලංකා ........................................................................ ගීයකි

13. තාලයේ කුඩාම ඒකකය ........................................................................ නම් වේ.

14. සිතාරය වයනු ලබන්නේ ................................................................... ආධාරයෙනි.

15. බටනලාව ................................................... වාද්‍ය භාණ්ඩයකි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට පිළිතුර හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.**

16. සිතාරයේ නිර්මාතෘවරයා අමීර් ඛුෂ්රු පඬිතුමා ය. (      )

17. තාලයක දුර්වලම ස්ථානය ඛලිස්ථානය වේ. (      )

18. ගොයම් ගී සාමූහිකව ගයනු ලබන ගී විශේෂයකි. (      )

19. සංගීතයේ මාධ්‍ය අංග චලන වේ. (      )

20. තාලයත් ගීතයත් එකවර ආරම්භ වීම විෂම ග්‍රහය යනුවෙන් හඳුන්වයි. (      )

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න 03 කට පමණක් පිළිතුරු සපයන්න.**

(01) i. බිලාවල් රාගයේ ආරෝහණ අවරෝහණ ලියන්න. (ල. 02)
ii. බිලාවල් රාගයට අයත් ස්වර ස්ථාපන ගීතයක් ප්‍රස්තාර කරන්න. (ල. 06)
iii. සරි සරිග, රිග රිගම යන ස්වර අභ්‍යාසය උච්ච ස දක්වා විස්තාරණය කර ලියන්න. (ල.02)

(02) i. පහත සඳහන් වචන අතුරින් <u>තාලයක කොටස් පමණක්</u> තෝරා ලියන්න.
මාත්‍රා/ වාදී ස්වරය / ස්ථායී / විභාග / ආවර්ත / අනුතාල / සමග්‍රහය / මිස්රාබය (ල. 02)
ii. ඔබ උගත් මාත්‍රා 10 සහ 14 යෙදෙන තාල පද දෙක නම් කරන්න. (ල. 02)
iii. ඉන් ඔබ කැමති එක් තාලයක් තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න. (ල. 03)
iv. එම තාලයට අනුව රිද්ම රටා තුනක් නිර්මාණය කරන්න. (ල. 03)

(03) (a) උතුරු ඉන්දියානු තත් වාද්‍ය භාණ්ඩයකි.
(b) මිස්රාබයක් ආධාරයෙන් හඬ උපදවා ගනී.
(c) ප්‍රධාන තත් හතරකි.
(d) වංග සංගීතයේ දී යොදා ගනී.
(e) ප්‍රධාන තත් හතකි.
(f) බෙංගාලි ප්‍රදේශයේ ප්‍රචලිත වාද්‍ය භාණ්ඩයකි.
(g) උත්තර භාරතයේ ප්‍රධාන තත් වාද්‍ය භාණ්ඩය යි.
(h) අලුව ආධාරයෙන් හඬ උපදවා ගනී.

i. ඉහත දක්වා ඇත්තේ තත් වාද්‍ය භාණ්ඩ දෙකක් පිළිබඳවය. එම භාණ්ඩ දෙක නම් කරන්න. (ල. 02)
ii. ඔබ හඳුනාගත් වාද්‍ය භාණ්ඩ දෙක අනුව කරුණු වෙන් කර දක්වන්න. (ල. 04)
iii. ඉන් ඔබ කැමති එක් භාණ්ඩයක රූප සටහනක් ඇඳ කොටස් හතරක් නම් කරන්න. (ල. 04)

(04) i. "මුහුදු පතුල යට ඉඳලා" සහ "අන්න බලන් සඳ" යන ගීත ඇතුළත් නාට්‍ය දෙකක් නම් කරන්න. (ල. 04)
ii. ඉන් ඔබ කැමති ගීයක ස්ථායී කොටසක් ලියන්න. (ල. 06)

(05) පහත දක්වා ඇති මාතෘකා අතරින් හතරක් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. $\left(2\frac{1}{2} \times 4\right)$
i. ආවර්ත
ii. ගොයම් ගී
iii. විභාග
iv. උපදේශාත්මක ගී
v. ත්‍රිවිධ සප්තකය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# පළමු වාර පරීක්ෂණය - 2019

## පෙරදිග සංගීතය 08 ශ්‍රේණිය

## පිළිතුරු පත්‍රය

**I** කොටස

| | |
|---|---|
| 1 - i | 11 - නූර්ති |
| 2 - ii | 12 - දේශාභිමානී |
| 3 - i | 13 - මාත්‍රාවයි |
| 4 - iv | 14 - මිස්රාබය |
| 5 - iii | 15 - සුෂිර |
| 6 - ii | 16 - (✓) |
| 7 - i | 17 - (✓) |
| 8 - iv | 18 - (✓) |
| 9 - iii | 19 - (x) |
| 10 - iii | 20 - (x) |

**II** කොටස

(01) i. ආරෝහණ අවරෝහණ ලිවීමට එක් ලකුණ බැගින් (ල. 02)
ii. ස්වරස්ථාපන ගීතයක් ප්‍රස්තාර කිරීම (ල. 06)
iii. ස්වර අභ්‍යාසය උච්ච ස දක්වා විස්තාරණය කිරීමට (ල. 02)
මුළු ලකුණු 10

(02) I. විභාග/ආවර්ත/අනුතාල/සමග්‍රහය ලකුණු 1/2 x 04 බැගින් (ල. 02)
ii. මාත්‍රා 10 - ජප් තාලය, මාත්‍රා 14 - දීප්චන්දි තාලය (ල. 02)
iii. තාල සංඥා සහිතව ප්‍රස්තාර කිරීමට (ල. 03)
iv. තාලය අනුව රිද්ම රටාවකට ලකුණ බැගින් රිද්ම රටා තුනට (ල. 03)
මුළු ලකුණු 10

(03) I. සිතාරය , එස්රාජය (ල. 01)
ii. (a) සිතාරය (b) සිතාරය (c) එස්රාජය (d) එස්රාජය
(e) සිතාරය (f) එස්රාජය (g) සිතාරය (h) එස්රාජය (ලකුණු 1/2 x 8 ) (ලකුණු 04)

iii. කැමති භාණ්ඩයක රූප සටහන ඇඳීමට ලකුණු එකක් ද, කොටස් හතරක් නම් කිරීමට ලකුණු එක බැගින් ලකුණු හතරක් ද ලබා දෙන්න. (ලකුණු 05)

(04) i. මුහුදු පතුල යට ඉඳලා - මූදු පුත්තු නාට්‍යය
අන්න බලන් සඳ - කුණ්ඩලකේෂී නාට්‍යය
(එක් නාට්‍යකට ලකුණු දෙක බැගින් ලකුණු 04)

ii. ස්ථායි කොටසක් ලිවීමට (ලකුණු 06)

(05) එක් කොටසකට ලකුණු 2 1/2 බැගින් කොටස් හතරකට (ලකුණු 10)